**සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම - 2016/2017**

------------------------------------------------------------------------

සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ 2016 අප්‍රේල් 01 දින සිට 2018 මාර්තු 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2016/2017 හා 2017/2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-------------------------------------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------------

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016/2017 හා 2017/2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

------------------------------------

සමාගම විසින් පිළියෙළ කරන ලද 2015 මාර්තු 31 දිනට හා 2016 මාර්තු 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | **2016 මාර්තු 31** | **2015 මාර්තු 31** |
|---|---|---|
| | **වටිනාකම** | **වටිනාකම** |
| | **රු. මිලියන** | **රු. මිලියන** |
| ජංගම නොවන වත්කම් | 20.07 | 24.02 |
| ජංගම වත්කම් | 116.71 | 101.06 |
| හිමිකම | (48.42) | (37.69) |
| ජංගම නොවන වගකීම් | 28.15 | 34.80 |
| ජංගම වගකීම් | 157.05 | 127.96 |

| | | |
|---|---|---|
| | - | |
| ආදායම් | 133.70 | 165.56 |
| වියදම් | 147.03 | 150.32 |
| අතිරික්තය/(ඌණතාවය) | (13.33) | 15.24 |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | අලාභ හා හානි පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | 2016 ජනවාරි 21 දින හා 2018 ජූලි 02 දින සිදු වූ යතුරු පැදියේ හා වෑන් රථයේ අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා අවසන් වාර්තා 2018 ඔක්තෝබර් 22 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 (ආ) හා (ඇ) සහ 1646 | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1647(3) හා මුදල් රෙගුලාසි 11 කාණ්ඩයේ VI උපලේඛනය | වාහන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.11 ඡේදය | මාස 06 කට වරක් වාහන වල ඉන්ධන පරිභෝජනය පරීක්ෂාව කළයුතු වුවත් සමාගම එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1978 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්යසාධනය
----------------

3.1.1 සැලසුම් කිරීම
----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එසේම එම චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර, විගණනයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙනද නොතිබුණි.

3.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය
-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සමාගම විසින් ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

(i) කුකුළු ආහාර නිපදවීම සඳහා අවශ්‍ය පසුබිම සකසා ගැනීම, කුකුළු ආහාර නිපදවීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම, කුකුළු ආහාර නිපදවීම හා විකිණීම

(ii) ගවයින් සජීවි හා අජීවි කොටස් විකිණීම, අභිජනනය, ආනයනය, අපනයනය, සැකසීම හා ගණුදෙනු කිරීම.

(iii) බටර්,චීස් හා අයිස්ක්‍රීම් සැකසීම, විකිණීම, ආනයනය, අපනයනය, හා ගණුදෙනු කිරීම.

(iv) ධාන්‍ය නිෂ්පාදනය හා ධාන්‍ය වර්ග, පලතුරු, පිටි තොග හා සිල්ලර වෙළඳාම

(ආ) 2017 වර්ෂය සඳහා සමාගම විසින් කාර්යසාධන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර ඇත්තේ පශු සම්පත්වල භෞතික ප්‍රගතිය පමණක් වන අතර , සමාගම සතු ගොවිපලේ කෘෂි, අනෙකුත් වගාවන් හා ඉදිකිරීම් ආදියේ ප්‍රගතිය ඇතුලත්ව සමස්ත ආයතනයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය දැක්වෙන කාර්යයසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්
-----------------------------

2016/2017 වර්ෂය වෙනුවෙන් ආයතනය විසින් පිරිවැටුම මත සියයට 0.5 ක ආර්ථික සේවා ගාස්තුවක් 2017 අප්‍රේල් 20 දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, එම වර්ෂය සඳහා සමාගමේ ප්‍රකාශිත පිරිවැටුම වූ රු. 172,941,952 ක් මත ආර්ථික සේවා ගාස්තුව 2018 ඔක්තෝබර් 25 දිනවන විටත් ප්‍රේෂණය කර නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 ජනවාරි මාසයේ සිට පෙබරවාරි මාසය දක්වා සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාව අනුව බොයිලර් කුකුලන් කාණ්ඩ 07 න් එක් කාණ්ඩයක කුකුලන් 1,993 ත් 4,934 ත් අතර පරාසයක ප්‍රමාණයක් සඳහා සත්ව ආහාර ලබාදීමේ සටහන් පරීක්ෂා කිරීමේදී සතෙකු වැඩුනු දිනගණනට අදාල ප්‍රමිතගත බරට වඩා සත්‍ය වශයෙන් ග්‍රෑම් 65 සිට ග්‍රෑම් 307 දක්වා පරාසයකින් අඩු බර ප්‍රමාණයකින් යුක්ත බව නිරීක්ෂණය විය. කුකුළු ආහාර නියමිත ප්‍රමිතයට නොමැති වීම එයට හේතු වී තිබුණි. කුකුළු ආහාර නියමිත ප්‍රමිතියට නොවීමෙන් සතුන්ගේ බර අඩුවීම සමාගමේ ආදායම අඩුවීමට හේතු වී තිබුණි.

(ආ) සමාගමේ බොයිලර් කුකුළු පැටවුන් විකිණීම ප්‍රධානම ආදායම් ප්‍රභවය වන අතර එම සතුන් විකිණීම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම, ඒ සඳහා පවතින වෙළෙඳ පොළ අවිනිශ්චිතභාවය හා නිසි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම මත 2016 ජනවාරි මස සිට 2018 සැප්තැම්බර් දක්වා එක් පැටවෙකුගේ වෙළෙඳ පොළ විකුණුම් මිල රු.30 ත් රු. 150 ත් අතර දැඩි උච්ඡාවචන පැවතීම හේතුවෙන් සතෙකුගේ සාමාන්‍ය පිරිවැය වූ රු. 46 ක අගය පවා බොහෝ අවස්ථා වල ආවරණය කරගත නොහැකි තත්වයකට පත්වී තිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

2015 වර්ෂය දක්වා දෛනිකව ආහාර ටොන් 3ක් පමණ නිෂ්පාදනය කළ හුරිගස්වැව කුකුළු ආහාර නිෂ්පාදන අංගනයේ සවි කර ඇති යන්ත්‍රය 2015 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 25 දක්වා නිෂ්පාදන කටයුතු වල යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ කාර්යාලයේ සේවය නියුතු නිලධාරීන් 33 දෙනෙකුට විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 25 දින දක්වාම කාර්ය පැවරුම් ලිඛිතව ලබා දී නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.2 ඡේදය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයක් සකස් කර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු අතර එම චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය අනුව සමාගමේ බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටියක් සකස් කර ඒ සඳහාද අදාල අමාත්‍යාංශයේ හා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 4.5 වාහන පාලනය

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ඩබල් කැබ් රථයක් සභාපති විසින් භාවිතා කරන බව විගණනය විසින් 2018 ඔක්තෝබර් 22 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. නමුත් එම වාහනය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙන් ලබා ගැනීම සම්බන්ධයෙන් හා සභාපති වෙත අනුයුක්ත කිරීම සම්බන්ධ කිසිදු ලිඛිත ලියවිල්ලක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හෝ මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමේ නොතිබුණි.

(ආ) 2015 ජූලි 08 දිනැති අංක BD/RDS/124/CM/07 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහවැලි අධිකාරියට අයත් සමාගම විසින් භාවිතා කර තිබූ ලොරි රථ 05 ක් සමාගමේ අදාල අමාත්‍යාංශය වන ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පවරා දීමට අනුමැතිය ලබාදී තිබූ නමුත් 2018 ඔක්තෝබර් 25 දක්වා එම වාහන පවරා දී නොතිබුණ අතර අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව අළුත්වැඩියා කිරීමට ද කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

### 5.1 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල යුතු අතර ඉන්පසු එලඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කල යුතුය. එසේ වුවද සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) 2017 මාර්තු 15 දිනෙන් පසුව අතිරේක 33 මඟින් සංශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 2.14.1 ප්‍රකාරව රු.මිලියන 100 ත් රු.මිලියන 250 ත් අතර වටිනාකමින් යුතු ප්‍රසම්පාදන කටයුතු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් විවෘත තරගකාරි ලංසු කැඳවීමේ පරිපාටිය මඟින් සිදු කළයුතු නමුත් 2017/2018 වර්ෂය සඳහා රු.113,232,452 ක වටිනාකමක් සහිත ආහාර මිලදී ගැනීම් එසේ ප්‍රසම්පාදන කමිටු පත් කිරීමෙන් තොරව හා අවශ්‍ය සත්ව ආහාර වලට නියමිත පෝෂණ සාන්ද්‍රණය පිළිබඳ පිරිවිතර සකසා ඉදිරිපත් කිරීමෙන් හෝ මිලකැඳවීමෙන් තොරව 2015 දෙසැම්බර් 17 දිනැති සභාපති ගේ ලිපියකට අනුව එක් පුද්ගලික ආයතනයක් මඟින් මාස තුනෙන් තුනට නැවත ඇණවුම් ක්‍රමය යටතේ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2017 මාර්තු 15 දිනැති අතිරේක 33 මඟින් සංශෝධිත ඡේද අංක 2.14.1 ඡේදය ප්‍රකාරව රු.මිලියන 5 ත් රු.මිලියන 8 ත් අතර වටිනාකමින් යුතු ප්‍රසම්පාදන කටයුතු වෙළෙඳ පොල මිල සැඳහුම් ක්‍රමය යටතේ අවමය ආයතන 3 කින් මිල කැඳවීම් ලබාගෙන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු මඟින් සිදුකළ යුතු නමුත් ඊට පටහැනිව මිල කැඳවීමෙන් තොරව එක් ආයතනයකින් නැවත නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය යටතේ 2017/2018 වර්ෂය සඳහා රු. 7,624,540 ක වටිනාකමට මව් සතුන් මිලදී ගෙන තිබුණි.

### 5.2 අයවැය පාලනය

-----------------

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද විධිමත් වූ අයවැය ලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන කටයුතු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පැවතීම. |
| (ආ) | වත්කම් පාලනය | වත්කම් විධිමත් ලෙස පවරා නොගැනීම හා වත්කම් නිෂ්කාර්යව පැවතීම. |
| (ඇ) | ලේඛන පවත්වා ගැනීම | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකිරීම. |
| (ඈ) | වාහන පාලනය | තොරතුරු ඇතුළත් කර වාහන ලොග් පොත් සම්පූරණ කර නොතිබීම, වාහන පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු නොකිරීම, ගොවිපලට ඇතුළුවන හා පිටවන වාහන පිළිබඳ නිසි පරීක්ෂාවක් සිදු නොකිරීම. |
| (ඉ) | නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව | පෞද්ගලික ලිපිගොනු අංකනය කර පවත්වා නොගැනීම, නිලධාරීන්ගේ චර්යා සටහන් පත්‍ර යාවත්කාලීන කරමින් පවත්වා නොගැනීම, නිලධාරීන්ගේ අධ්‍යාපන සහතික වල නිවැරදිභාවය තහවුරු කර නොතිබීම. |